# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,469 — 1958 අගෝස්තු 5 වැනි අඟහරුවාද — 5.8.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1958 අංක 338**

ජී. ජී. ඕ. අංකය : ඇන්. 87/58.

1958 වේ අංක 17 දරණ පරීක්ෂණ කොමිෂන් සභා ආඥාපනතේ 17 (1) වෙනි වගන්තිය යටතේ, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, වාණිජ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ වාණිජ සහකාර සී. එච්. ජේ. ඇස්. පී. අමරතුංග මහතා, 1958 වේ ජූලි මස 31 වෙනි දින සිට ලංකාවේ ලියා පදිංචි කළ නැව් සමාගම් වල වැඩ කටයුතු පරීක්ෂා කිරීමට පත්කර ඇති කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් පත්කරනු ලැබ සිටී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1958 වේ අගෝස්තු මස 4 වෙනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලය.

---

# මිල පාලන දැන්වීම්

1. 1958 ජූලි මස 17වෙනි දින අංක 11,432 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1958 ජූලි මස 17වෙනි දින වී. 48 දරණ මිළ නියෝගයේ වී 47 හා 25.6.58 යන්න වී. 47 හා 20.6.58 වශයෙන් පළමුවෙනි කොටස සංශොධනය විය යුතුයි.

2. මීට යාකර ඇති ලේඛනයේ 2 වැනි තීරයේ සිට 5වැනි තීරය දක්වා ඇති තීරවල අනු පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් තොග වශයෙන් විකිණීමේදී හා සිල්ලර වශයෙන් විකිණීමේදී අර්තාපල් වල මිළ නියෝගය අංක 4 සම්බන්ධයෙන් සංශොධනය කරණ ලදී.

3. ආහාර මිළ නියෝගයේ 3වැනි කාණ්ඩය පහත සඳහන් අයුරින් කියවෙන පිළිවෙලට සංශොධනය කරණ ලදී.

" මෙම උපලේඛනයේ 1වැනි තීරයෙහි සඳහන් ද්‍රව්‍ය පිළිබඳව 1958 ජූලි මස 25වැනි දින අංක 11,373 දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධව 1958 ජූනි මස 20 වෙනි දින වී 47 දරණ ආහාර මිළ නියෝගයේ 3 සිට 8 දක්වා ඇති ඡේදයන් මෙම නියෝගයෙන්හිම අන්තර්ගත වූ හැටියට සැලකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

### උප ලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | | 3 වැනි තීරය | | 4 වැනි තීරය | | 5 වැනි තීරය | |
|---|---|---|---|---|---|---|---|---|
| | වවුනියාව, පුදුකුලම්, ආඩ්කුලම්, කලලිකුලම්, ඊරට්පෙරිය කුලම්, මඩුකන්ද සහ නෙලු කුලම් | | පලනිපායි, නාවට්කුලම්, මරුද් මඩු, රාසෙන්දිරකුලම්, සුදු වැන්දපුලවු, මාමඩුව, උළු කුලම, වලෙයිවයිතකුලම්, වෙඩඩිකුලම්, කප්පච්චි, පලයමොදයි, අනන්තර් පුලියන්කුලම්, මාන්කුලම්, ඔලුමඩු, මරුතොඩයි, නෙදුන් කර්නි | | මුලතිව් සහ වෙල්ල මුල්ලවයි කාල් | | කරුපොදයි මුරිප්පු, කච්චිලා මඩු, අම්පලයි පොක්කුනායි, පුක්කුකුඩි ඉරිප්පු කුමුල මුනයි, තන්නියුත්තු, මුලයි වලෙයි, කොක්කුතොඩුවායි, කෝකිලායි | |
| | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. |
| අර්තාපල් | 32 0 | 0 32 | 33 50 | 0 34 | 35 0 | 0 35 | 36 50 | 0 36 |

2183—ජේ. ඇන්. ආර් 25405—4,725 (8/58)

1. 1958 ජූලි මස 25 වෙනි දින අංක 11,373 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1958 ජූනි මස 20 වෙනි දින වී 47 දරණ මිළ නියෝගය අංක 2 සිට 3 දක්වා තීර යන්න වෙනුවට අංක 2 සිට 5 දක්වා යනුවෙන් පළමුවෙනි කොටස සංශොධනය විය යුතුය.

2. මීට යාකර ඇති ලේඛනයේ 2 වැනි තීරයේ සිට 5 වැනි තීරය දක්වා ඇති තීරවල අනු පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් තොග වශයෙන් විකිණීමේදී හා සිල්ලර වශයෙන් විකිණීමේදී ලූනු වර්ගවල (රතු ලූනු හැර අනිකුත් ලූනු වර්ග) මිළ නියෝගය 1 වැනි තීරයේ අංක 1 සම්බන්ධයෙන් සංශොධනය කරණ ලදී.

## උප ලේඛනය

| 1වැනි තීරය | 2වැනි තීරය | | 3වැනි තීරය | | 4වැනි තීරය | | 5වැනි තීරය | |
|---|---|---|---|---|---|---|---|---|
| | වවුනියාව, පුදුකුලම්, ආඩිකුලම් කල්ලිකුලම්, ඊරට්පෙරිය කුලම්, මඩුකන්ද සහ නෙලු කුලම් | | නාවට්කුලම්, මරුද මඩු, රාසෙන්දිරකුලම්, සුදු වැන්දපුලවු, මාමඩුව, උළු කුලම, වලෙයිවයිතකුලම්, වෙඩඩිකුලම්, කුප්පච්චි, පලය මොදයි, අනන්තර්, පුලියන් කුලම්, නාකගරායන්කුලම්, මාන් කුලම්, ඕලුමඩු, මරුකොබායි, නෙදුන්කර්නි පලනිපුඩි | | මුලතිව් සහ වෙල්ල මුල්ලවයි කාල් | | කරුපොදයි මුරිප්පු,කච්චිලා මඩු, අම්පලයි පොක්කුපනායි, පුක්කුකුඩි ඉරිප්පු, කුමුල මුනයි, තන්නියුත්තු, මුල්ලිය වලෙයි, තුක්කුතොඩුවායි, කෝකුලායි | |
| විස්තර | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. |
| ලූනු වර්ග (රතුලූනු හැර) | 23 0 ... | 0 23 ... | 24 50 ... | 0 24 ... | 26 0 ... | 0 25 ... | 27 50 ... | 0 26 |

---

අංක කේ/යු/10/58 දරණ ආහාර මිල නියෝගය. අතිරේක ආහාර ද්‍රව්‍ය.

## 1950හේ අංක 29 දරන මිල පාලන පනත

### නියෝගය

කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිල පාලක තැන්පත් ගාර්දියේ පුංචි හේවාගේ බුද්ධදාස ද සිල්වා වන මම 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 4 වැනි වගන්තියෙන් හා එම පනතේ 3 (2) වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) මීට යා කොට ඇති උප ලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයක් හෝ ඒ ද්‍රව්‍ය සියල්ලම හෝ සම්බන්ධයෙන් තොග වෙළෙන්දෙකු වශයෙන් කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය තුල කවර තැනක වුව ද, ව්‍යාපාරයක් පවත්වා ගෙන යන සෑම පුද්ගලයෙකු විසින්ම පහත සඳහන් කරුණු දක්වෙන වාර්තාවක් අගෝස්තු මස 6වැනි දයින් පටන් ගන්නා සතියේ පටන් සෑම සතියක් පාසාම එවිය යුතු බව මෙයින් නියෝග කරමි ;

(2) (අ) ඉහතකී සතිය අවසානයේදී ඉතුරුවී ඇති ඒ ඒ ද්‍රව්‍ය තොගය, සතිය තුල දී මිලට ගත් ද්‍රව්‍ය ප්‍රමාණය හා එම ද්‍රව්‍යයන් සතිය තුල දී ලබා ගැනීමට පිළියෙල කොට ඇති ප්‍රමාණය ;

(ආ) ඒ තොග තබා ඇති එක් එක් ගබඩාව හෝ අන්‍ය ස්ථාන.

මේ වාර්තාව එවන ලෙස නියම් කරනු ලබන්නේ මේ නියෝගයද, 1950 අංක 29 දරණ මිල පාලන පනතද සමඟ කිය විය යුතු 1950 දෙසැම්බර් 8වැනි දින අංක 10,186 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ 1950 මිල පාලන රෙගුලාසි වල 2වැනි රෙගුලාසිය යටතේය.

1958 ජූලි මස 26වැනි දින පෙරවරු 10ට කුරුණෑගලදී අත්සන් කරන ලදී.

ජී. පී. බී. ද සිල්වා,
සහකාර ආහාර මිළ පාලක, කුරුණෑගල දිස්ත්‍රික්කය.

## උපලේඛනය

| | | |
|---|---|---|
| කොත්තමල්ලි | ලූනු (ලෙබනිස් වර්ගය) | තෝර පරිප්පු |
| සුදුරු | රතුලූනු | උලුඳු (පියලි නොකළ) |
| සුදුලූනු | උම්බලකඩ | උලුඳු (පියලි කළ) |
| වියළි මිරිස් | මසූර් පරිප්පු | චික්පීස් |
| අර්තාපල් | මුංඇට | කඩල පරිප්පු |
| ලොකු ළූණු හෝ බොම්බයි ළූණු | කඩල | සියළුම කරවල වර්ග |

සියලු වර්ගවල කිරි ආහාර ද්‍රව්‍ය/උකුකළ කිරි සහ පිටි කළ කිරි ඇතුළත්ය'

අංක එෆ්. සී/වී — ඇස්. එෆ් 3 (3) දරණ මිල නියෝගය

එළුමස්.

## 1950 අංක 29 දරණ මිල පාලන පණත

### නියෝගය

කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක තැන්පත් සතරසිංහගේ දෙන් සුගතදස වන මම, 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 4 වෙනි ඡේදය හා 3(2) ඡේදයෙන්ද මා කෙරෙහි පවරා ඇති බලතල අනුව—

(1) 1958 ජූනි මස 17 වෙනි දිනය හා 11,362 වෙනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1958 ජූනි 16 වෙනි දිනය හා එෆ්සී/වීඇස්ඇෆ් 3(2) වෙනි අංකය දරණ ආහාර මිල නියෝගය අද දින සිට මෙයින් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උප ලේඛනයේ 2, 3 සහ 4 වෙනි තීරයන්හි සඳහන් මිළ, එළුමස් රාත්තලක වැඩිම මිළ වශයෙන් නියම කරමි. එම තීරයන්හි මුදුනේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස්, එම උප ලේඛනයේම 1 වෙනි තීරයේ සඳහන් කොට ඇති ප්‍රදේශය තුළ එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) ''එළුමස්'' යනුවෙන් හැඟවෙන්නේ බැටළුවෙකුගේ හෝ එළුවෙකුගේ මාංශයයි. බොකු, බඩවැල් ආදී සියළු ආකාර ඉවත් කරුණු ලබන දය මීට ඇතුළත් නොවේ.

(ආ) බැටළුවෙකුගේ හෝ එළුවෙකුගේ සිරුර විකිණීම සඳහා මස්මඩුවේ පිළියෙල කොට ඇති පරිදි (එනම් : හිස, හම, බොකු බඩවැල්, කුර සහ වෙනත් සියළු විධියේ සාමාන්‍යයෙන් ඉවත් කරණු ලබන දය අතහැර) විකුණන විට ''තනි බර අනුව'' විකිණීමක් ලෙස සළකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) කටු සහිත එළුමස් විකුණන කල්හි විකුණන මුළු බරින් සියයට 25 කට වඩා කටුවල බර වැඩි නොවිය යුතුයි.

(5) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම කිසිම තැනක, වාහනයක හෝ යාත්‍රාවක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ, උප ලේඛනයෙහි සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් ඇති සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උප ලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරනලද දැන්වීමක් එකී ස්ථානයේ, වාහනයේ හෝ යාත්‍රාවේ පැහැදිලිව පෙනෙන ලෙස තැබිය යුතුයි.

(6) ඉවත් කරණු ලබන දය සමග එළුමස් එනම්, ගණුදෙනුවකදී විකුණනු ලබන විට එළුමස්, ඉවත් කරණු ලබන දයින් වෙන් වශයෙන් කිරා විකිණිය යුතුයි.

(7) සෑම වෙළෙන්දෙකුම එළුමස් විකුණන කල්හි, එළුමස් ලබාගන්නාට සැබෑ බර පහසුවෙන් බලා ගැනීමට හැකි වන සේ බර කිරණ තරාදිය හෝ තරාදි තැබිය යුතුයි.

(8) මීට යාකර ඇති උප ලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් විකුණන සෑම වෙළෙන්දෙකුම, එළුමස් ලබාගන්නකු ඉල්ලා සිටිය විට කුවිතාන්සියක් දිය යුතුයි. එම කුවිතාන්සියේ—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ එළුමස් ප්‍රමාණය (බර) ;

(ඇ) විකුණූ එළුමස්වල විස්තරය ; සහ

(ඈ) විකුණූ මස් ප්‍රමාණයට ගෙවූ මුදලද,

සඳහන් විය යුතුයි.

(9) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරන ලද සෑම ප්‍රදේශයක් තුළ, කිසිවෙකු උප ලේඛනයේ සඳහන් දය වෙන කිසියම මසක් හෝ මාංශයක් සමග කළවම් කොට නොවිකිණිය යුතුයි ;

(10) උප ලේඛනයෙහි සඳහන් දය විකුණන කල්හි, එකී දය ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක මිළක් වේනොත් එය එම උපලේඛනයෙහි 2,3 සහ 4 වෙනි තීරයන්හි සඳහන් වැඩිම මිළෙහි අන්තර්ගත වේ.

(11) මෙම නියෝගයෙහි කාර්‍ය්‍ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා.'' යන්නෙන් හැඟවෙන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

1958 අගෝස්තු 5වෙනි දින පස්වරු 12.05ට කොළඹ කච්චේරියේ අත්සන් කරන ලදී.

ඇස්. ඩී. සුගතදස,
කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

## උපලේඛනය

### එළුමස් සඳහා වැඩිම මිළ

| 1වෙනි තීරය<br>ප්‍රදේශය | 2වෙනි තීරය<br>එළුමස් (කටු රහිත)<br>රාත්තලක වැඩිම මිළ<br>රු.ශ. | 3වෙනි තීරය<br>එළුමස් (කටු සහිත)<br>රාත්තලක වැඩිම මිළ<br>රු.ශ. | 4වෙනි තීරය<br>එළුමස් (තනිබර අනුව)<br>රාත්තලක වැඩිම මිළ<br>රු.ශ. |
|---|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කය (කොළඹ නගර සීමාවෙන් පිටත) ... | 2 15 ... | 1 85 ... | 1 60 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේ ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන් ය. එම මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකියි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.